ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශාස්ත්‍රවේදී දෙවන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/අගෝස්තු
ආර්ථික විද්‍යාව

# ECON 2110.03/ECON 2110 – අන්තර්මධ්‍ය සූක්ෂම ආර්ථික විද්‍යාව

කාලය පැය තුන (03) යි. ඕනෑම ප්‍රශ්න පහ (05)කට පමණක් පිළිතුරු සපයන්න.

1. i. හීනවන ආන්තික උපයෝගිතා න්‍යාය යනු කුමක් ද?

(ලකුණු 02)

ii. පහත සඳහන් වගුවේ දැක්වෙන්නේ X හා Y භාණ්ඩ දෙක සඳහා පාරිභෝගිකයෙකුගේ ආන්තික උපයෝගිතාවන් ය. X හා Y භාණ්ඩ දෙකම ඒකකයක් රු. 02 බැගින් මිල වන අතර මුළු ආදායම රු. 20ක් වේ.

| භාණ්ඩ ඒකක | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| X වල ආන්තික උපයෝගිතාව (MUx) | 16 | 14 | 11 | 10 | 9 | 8 | 7 | 6 |
| Y වල ආන්තික උපයෝගිතාව ($MU_Y$) | 15 | 13 | 12 | 8 | 6 | 5 | 4 | 3 |

පාරිභෝගික සමතුලිතය දක්වන්න.

(ලකුණු 03)

iii. උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් පාරිභෝගික සමතුලිතය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. උපේක්ෂා වක්‍ර යොදාගෙන 'විවේකය හා ආදායම අතර ගැටුම' විස්තර කරන්න.

(ලකුණු 06)

2. i. 'හීනවන ඵලදායිතා නීතිය' යනු කුමක් ද?

(ලකුණු 02)

ii. ආන්තික ආදේශන තාක්ෂණ අනුපාතය සහ පරිමාණානුකූල ඵල අතර වෙනස දක්වන්න.

(ලකුණු 05)

iii. පහත සඳහන් ශ්‍රිතය සැලකිල්ලට ගන්න.

$$Q = AK^{0.5}L^{0.5}$$

(a). සාධකවල ආන්තික ඵලදායීතාව සඳහා සමීකරණ ලබාගන්න.

(ලකුණු 02)

(b). නිෂ්පාදන ශ්‍රිතයේ පරිමාණානුකූල ඵල ස්වභාවය කුමක් ද?

(ලකුණු 02)

iv. 'නිෂ්පාදනයේ අවම සාධක පිරිවැය සංයෝගය රඳා පවතින්නේ ශිල්පීය ආදේශන හැකියාව සහ සාධකවල මිල ගණන් මතය.' පැහැදිලි කරන්න.

(ලකුණු 05)

3. i. ආයතනයක සමතුලිතය සඳහා අවශ්‍ය වන අත්‍යාවශ්‍ය සහ ප්‍රමාණවත් කොන්දේසි මොනවාදැයි දක්වා පූර්ණ තරගකාරී ආයතනයක එම කොන්දේසි ඉටුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. පූර්ණ තරගකාරී සහ ඒකාධිකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතය සන්සන්දනය කරමින් විග්‍රහ කරන්න.

(ලකුණු 10)

4. i. මිල විශ්ලේෂණයක යෙදී සිටින ඒකාධිකාරයෙකු ඔහුගේ නිමැවුම විවිධ වෙළෙඳපළවල බෙදාහැර ඒ සඳහා විවිධ මිල ගණන් අය කරන්නේ කෙසේ ද?

(ලකුණු 08)

ii. ඒකාධිකාරී තරග වෙළෙඳපොළක කටයුතු කරන ආයතනයක කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය විග්‍රහ කරන්න.

(ලකුණු 08)

5. පූර්ණ තරගකාරී හා ඒකාධිකාරී තරග වෙළෙඳපොළවල කෙටිකාලීන හා දිගුකාලීන සමතුලිතය සන්සන්දනය කරමින් විග්‍රහ කරන්න.

(ලකුණු 16)

6. i. කතිපයාධිකාරී වෙළෙඳපොළක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවාද?

(ලකුණු 04)

ii. අවම පිරිවැය ආයතනයේ මිල නායකත්වය යටතේ මිල හා නිමැවුම තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

7. කෙටි සටහන් ලියන්න.

i. හෙළිකළ වරණ න්‍යාය

(ලකුණු 08)

ii. පූර්ණ තරගකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය

(ලකුණු 04)

iii. සම්ප්‍රදායික (Traditional) සහ ප්‍රත්‍යක්ෂමූල (empirical) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර

(ලකුණු 04)

*************